

## Starter motor solenoid පරික්ෂා කිරීම

starter motor එකෙහි පීනියන් ගියර වීල් සහ flywheel ගියර වීල් එන්ජ්ම පණගන්වන අවස්ථාවේදී සම්බන්ධ කිරීම සහ මෝටරයට අවශ්‍ය ඉහල විදුලි ධාරාව සම්බන්ධ කිරීම යන කාර්යයන් මෙමගින් සිදු කරනු ලබයි.

පරික්ෂා කිරීමේදී විදුලි සැපයුම් සම්බන්ධ කරන අග්‍ර සම්බන්ධතාවය, Plunger එක ක්‍රියාත්මක කරවන ආකාරය පරික්ෂා කිරීම සිදු කළ යුතුයි...




## Starter motor solenoid අග්‍ර සම්බන්ධව පවතින ආකාරය

මෙහි අභ්‍යන්තරයෙහි Pull-in සහ Hold-in ලෙස දඟර දෙකක් පවතින අතර මෙම වයින්ඩින් දෙකෙහිම එක් කෙළවරක් 50 අග්‍රය ලෙස නම් කර තිබේ.

එන්ජිම පණ ගන්වන අවස්ථාවේදී ස්ටාර්ට් සිග්නල් එක මෙම අග්‍රයට සම්බන්ධ වේ. මෙහි Pull-in දඟරය එහි M අග්‍රය සමග මෝටරය හා ශ්‍රේණිගතව සම්බන්ධව පවතින අතර අනෙක් දඟරය බොඩිය හා සම්බන්ධ වී තිබේ.



## <u>පරීක්ෂාව</u>

**Pull-in Winding:** 50 අග්‍රයට ධන සැපයුමක් සම්බන්ධ කර M අග්‍රයට සෘණ සැපයුමක් සම්බන්ධ කළ විට Pull-in දගරයේ දෙකෙලවරට සැපයුම සම්බන්ධ වන අතර මෙහිදී Plunger එක අභ්‍යන්තරයට ඇද ගනී.

**Hold-in Winding:** 50 අග්‍රයට ධන සැපයුමක් සම්බන්ධ කර බොඩියට සෘණ සැපයුමක් සම්බන්ධ කළ විට Hold-in දගරයේ දෙකෙලවරට සැපයුම සම්බන්ධ වන අතර මෙහිදී Plunger එක අභ්‍යන්තරයට ඇද ගන්නේ නැත. එයට හේතුව අභ්‍යන්තරයට ඇද ගනු ලබන්නේ Pull-in Winding එක මගින් වන අතර එය රඳවා ගැනීම පමණක් මෙම Hold-in Winding එක මගින් සිදුකර කරනු ලබන නිසයි. ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් අතින් Plunger එක අභ්‍යන්තරයට තද කල විට Hold-in Winding ක්‍රියාත්මක බැවින් එක රඳවා ගනියි.

**+B සහ M අග්‍ර අතර සම්බන්ධතාවය පරීක්ෂා කිරීම:** ඉහත ක්‍රියාකාරකමට අදාළව Plunger එක අභ්‍යන්තරයට ගමන් කරවා මල්ටි මීටරයේ සම්බන්ධතා පරීක්ෂාව ඇසුරින් පරීක්ෂා කර ගත හැක.